**ළමා පරපුර**

# අනාගත ආයෝජනයක් වන ළමා සුවසෙත

ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සභාපති

**ආචාර්ය නිමල් සමරසුන්දර**


දෙවන ලෝක සංග්‍රාමයෙන් විපතට පත් පවුල්වල අනාථ වූ දරුවන් සුරැකීමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධව 1946 දෙසැම්බර් මස 11 වන දින ආරම්භ වූ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල හෙවත් යුනිසෙෆ් ආයතනය තම අරමුණු ව්‍යාප්ත කරමින් ලෝකය පුරා වෙසෙන දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳවත් ඔවුන්ගේ සෞඛ්‍ය අධ්‍යාපනය ආදිය පිළිබඳවත් සොයා බැලීමට හැකිවන සේ පුළුල් පදනමක් යටතේ 1953 දී පිහිටවනු ලැබූ අතර, එම සංවිධානයේ ක්‍රියාකාරකම් නිසා 1965 වර්ෂයේදී නොබෙල් සාම ත්‍යාගය ද දිනා ගනු ලැබීය. මෙම ළමා අරමුදලේ අවසාන වගකීම නැතහොත් ඉලක්කය වනුයේ ලෝකයේ ජීවත්වන සෑම දරුවකුට ම ඔවුන්ට හිමි මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමට අවස්ථාව සලස්වා දීමයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ප්‍රධාන වශයෙන් ළමයින්ට හිමිවිය යුතු මූලික අයිතිවාසිකම් 10 ක් දක්වා ඇත. එනම්

සෑම ළමයෙකුටම විෂමතාවකින් තොරව සමාන අයිතිවාසිකම් ලැබීමේ අයිතිය.

තමාගේ අනන්‍යතාව අනුව නාමික හා ජාතික වශයෙන් පෙනී සිටීමේ අයිතිය.

තමන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමේ අයිතිය.

තමාට අධ්‍යාපනය හා පුහුණුව ලබාගැනීමේ අයිතිය. ක්‍රීඩාව, විනෝදය හා විවේකය ලබාගැනීමේ අයිතිය. තමාගේ පෞද්ගලිකත්වය රැක ගැනීම මෙන්ම අන්‍යයන් හා සමගිව විසීමේ අයිතිය,



හදිසි උපද්‍රව අවස්ථාවන්හිදී ද ක්ෂණිකව පිහිට පැතීමේ මෙන්ම මෙහෙකාර සේවයෙහි නොයෙදීම.

කෲරත්වයට භාජනය නොවීමේ හා දඬුවම් වලින් ආරක්ෂා වීමේ අයිතිය.

තම පවුලේ පෞද්ගලික ආරක්ෂාව යටතේ නිවාසයක ජීවත්වීමේ අයිතිය,

අබාධිත අවස්ථාවන්හිදී පිහිට පැතීමේ අයිතිය.

කරුණු දැන ගැනීමේ හා නිදහස්ව හා ස්වාධීනව තම අදහස් ප්‍රකාශ කිරීමේ සහ එකට රැස්වීමේ අයිතිය ආදිය යි.

ළමා අයිතිවාසිකම් සුරැකීමේ විවිධ සංවිධාන අද ලොව පුරා ක්‍රියාත්මක වෙමින් පවතී. ළමා අරමුදල විසින් 1990 වර්ෂයේදී ළමා සංවර්ධනය සහ සුභසාධනය වෙනුවෙන් දස වැඩසටහන් සැලැස්මක් ක්‍රියාත්මක කරන ලදි. ඒ යටතේ වසර 2000 වන විට ළදරු මරණ සංඛ්‍යාව 1000 ට 50 - 70 දක්වා පහත දැමීම 1990 දී තිබූ වයස අවුරුදු පහට අඩු ළදරු මන්දපෝෂණ මට්ටම 50% කින් වත් අඩුකිරීම, මාතෘ මරණ අනුපාතිකය 1990 ට වඩා අඩකින් පහත දැමීම, ආරක්ෂිත පානීය ජලය සැපයීම, සනීපාරක්ෂක පහසුකම් සැලසීම, සියළුම ළදරුවන්ට මූලික අධ්‍යාපන පහසුකම් සැලසීම, පැසල් යන දරුවන්ගෙන් අවම වශයෙන් 80% ක් ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කිරීම, එකී දස වැඩසටහන් සැලැස්මට අයත් කරුණු අතර විය.

මීට අමතරව යුනෙස්කෝ සංවිධානය විසින් වසර 2000 දී සැමට අධ්‍යාපනය තේමාව යටතේ සාක්ෂරතාව සියයට සීයේ ඉලක්කය සපුරා ගැනීමට අපේක්ෂා කරන ලදී. ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙහෙයවීමෙන් ලෝකය පුරා ළදරු එන්නත් ව්‍යාපාර විශේෂයෙන් පෝලියෝ එන්නත් ආදිය සියයට සියයක් සාර්ථක කර ගැනීමට අපේක්ෂා කරන ලදී.

සාර්ක් සංවිධානය විසින් ද දකුණු ආසියානු කලාපයේ ළමයින්ගේ සෞඛ්‍යය, පෝෂණය හා ආරක්ෂාව නැංවීමට ද අතිකුත් මානව සම්පත් සංවර්ධනය, ජනගහන ස්ථාපනය, දිළිඳුකම තුරන් කිරීම, කාන්තා අයිතීන් සුරැකීම ආදී අංශ වලින් යුත් සාමාජික ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීම සඳහා සම්මත කොට ගෙන ඇති බව ප්‍රකාශයට පත් කර ඇත.

ළදරුවන් කෙරෙහි ජාත්‍යන්තර අවධානය මෙසේ වැඩි වශයෙන්ම යොමු වුව ද අපගේ දේශීය දරුවන් හට අද සමාජීය අර්බුද හේතුවෙන් විවිධ ප්‍රශ්න වලට මුහුණ පෑමට සිදුවී තිබීම ඉතාමත් ඛේදනීය තත්ත්වයකි. ලංකාවට පමණක් නොව තෙවැනි ලෝකයේ දුප්පත් රටවල් බොහොමයක මෙම තත්ත්වය දක්නට ලැබේ. විශේෂයෙන් සිවිල් හෝ අන්තර් ජාතික යුද්ධ වලට මැදිවී ඇති රටවල්වල තත්ත්වය වඩාත් භයානක ය. ලංකාව ද ඊට අයත්ය.

ලංකාවේ අවුරුදු 15 ට අඩු ළමා ජනගහනය මුළු ජනගහනයෙන් 35% පමණ වේ. එනම් ලංකාවේ ජනගහනයෙන් තුනෙන් එකක් ළමා ජනගහනය යි. අනාගත තරුණ පරම්පරාව වනුයේත්, සමාජයේ අනාගත වගකීම් හා කාර්යභාරයට උර දෙනුයේත් මොවුන් ය. මොවුන් එළදයී පුරවැසියන් වශයෙන් අනාගත සමාජයට දයාද කිරීමේ සම්පූර්ණ වගකීම පැවරී ඇත්තේ වත්මන් වැඩිහිටි ජන සමාජය වෙත ය. එකී වගකීම කෙරෙහි වැඩිහිටියන් වශයෙන් අප ප්‍රමාණවත් අවධානයක් හෝ සැලකිල්ලක් දක්වා ඇද්ද යන්න ප්‍රශ්නයකි.

අද ලංකාවේ දරුවන් මුහුණ පාන ප්‍රශ්න ප්‍රධාන වශයෙන් අධ්‍යාපනය ,සෞඛ්‍යය, පෝෂණය, ආරක්ෂාව යටතේ සිව් වැදෑරුම් කොට දැක් විය හැකිය.

දියුණු රටවල පාසල් වලට ඇතුළු වන දරුවන්ගෙන් සියයට 98 සිට 99 ක් පමණ ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ නොකර පාසල් වලින් ඉවත්ව යති.

දියුණු රටවලට සාපේක්ෂව බැලීමේදී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය අහිමි වන දරුවන් සංඛ්‍යාව ඉහළ ප්‍රතිශතයකි. මෙම ප්‍රතිශතය ඉතා අඩු මට්ටමක පවත්වා ගෙන ඒම

ප්‍රථම අවශ්‍යතාවය වේ. මීට බලපා ඇති සමාජමය හා ආර්ථිකමය සාධකයන් සොයා බලා ඒවාට පිළියම් යෙදිය යුතු ය.

යුද්ධය නිසා අවතැන් වීම, අනාරක්ෂිතවීම, අනාථවීම නිසා වැඩියෙන් පීඩාවටත් අවදානමටත් ලක් වී ඇත්තේ දරුවන් ය. මෙම ප්‍රධාන කරුණ හැරුන විට අද ජීවන වියදම ඉහළ යාමට සාපේක්ෂව වැටුප් මට්ටම ඉහළ නොයෑම හේතුවෙන් පවුලක එක් අයෙකු පමණක් රැකියාවක් කිරීමෙන් ලැබෙන ආදායම පවුලක තඩත්තුවට ප්‍රමාණවත් නොවන හෙයින් දෙමව්පියන් දෙදෙනාම රැකියාවල නිරතවීමට සිදුවී තිබේ. සමහර විට පාසල් යන වයසේ දරුවන් ද රැකියාවල නිරත කිරීමට සමහර දෙමව්පියෝ පෙළඹී සිටිති.

තවත් සමහර විටක පවුලේ කුඩා දරුවන් බලාගැනීම සඳහා වැඩිමහල් ගැහැනු දරුවා තිවසේ නවත්වා ගනු ලබන දෙමව්පියෝ ද සිටිති. විශේෂයෙන්ම ග්‍රාමීය දුප්පත් පවුල්වල මෙය බොහෝවිට දැකිය හැකි ය. තම ගොවිතැන් කටයුතු සඳහා දරුවන් යොදා ගැනීම නිසාද ඔවුන්ගේ පාසල් අධ්‍යාපනය කඩා කප්පල් වේ.

පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම, දරුවන් පාසල් වයස් කාලය තුළදී පාසල් වලින් ඉවත් කර නොගන්නා ලෙස දෙමව්පියන් දැනුවත් කිරීම, ළමා සුරැකීමේ මධ්‍යස්ථාන පහසුකම් ලබාදීම වැනි ක්‍රියා මාර්ග තුළින් දරුවන් පාසල් හැර යාම බොහෝ දුරට වළක්වා ගත හැකිය.

පෙර පාසල් නොහොත් මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳව රජයේත් පළාත් සභාවලත් විශේෂ උනන්දුවක් ඇතිවීම වැදගත් ය. ලංකාවේ දැනට පෙර පාසල් නොහොත් මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන 137000 ක් පමණ ක්‍රියාත්මක වන අතර වයස අවුරුදු 3 - 5 ත් අතර දරුවන් ලක්ෂ තුනකට ආසන්න සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබති.

මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන වල ඉගෙනුම ලබන දරුවන්ගෙන් අඩු වශයෙන් 35% ක් එනම් තුනෙන් එකක් පමණ මන්ද පෝෂණයෙන් පෙළෙන බවට වාර්තා වී ඇත. මෙම දරුවන්ගේ පෝෂණ මට්ටම නැංවීමේ වැඩ පිළිවෙලවල් මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන හරහා ක්‍රියාවට නැංවිය හැකි ය. මෙම දරුවන්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් නැංවීමට අවශ්‍ය පහසුකම් සැපයීම ආදිය මාර්ගයෙන් පූර්ව පාසල් වයසේ දීම දරුවා නිරෝගී දරුවකු ලෙස විධිමත් පාසල්වලට යැවීමට ඉන් හැකිවනු ඇත.

**විධිමත් පාසැල්වලට ඇතුළත්වන දරුවාගේ අධ්‍යාපනය පමණක් නොව ඔහුගේ චරිතය හැඩගැස්විම පෝෂණ මට්ටම ආරක්ෂා කර දීම බාලාපචාරයන් මඟින් වැළැක්වීම වැනි කරුණු කෙරෙහිද පාසල තුළදී ගුරුවරුන් තුළ උනන්දුවක් ඇති විය යුතු අතර. දෙමව්පියන් තුළ දැන්වත් කිරීමක් කළ යුතු ය**

විධිමත් පාසැල්වලට ඇතුළත්වන දරුවාගේ අධ්‍යාපනය පමණක් නොව ඔහුගේ චරිතය හැඩගැස්විම පෝෂණ මට්ටම ආරක්ෂා කර දීම බාලාපචාරයන් මඟින් වැළැක්වීම වැනි කරුණු කෙරෙහිද පාසල තුළදී ගුරුවරුන් තුළ උනන්දුවක් ඇති විය යුතු අතර. දෙමව්පියන් තුළ දැන්වත් කිරීමක් කළ යුතු ය. ලංකාවේ විධිමත් පාසැල් 2000 වසර වන විට 10977 ක් තිබූ අතර ඉන් 10338 ක් රජයේ පාසල් ය. රජයේ පාසැල්වල ගුරුවරුන් සංඛ්‍යාව දෙලක්ෂයක් පමණ වන අතර ශිෂ්‍ය - ගුරු අනුපාතය 22 ට 01 කි. ගුරුවරුන්ගේ මාර්ගයෙන් දෙමව්පියන්ට දරුවන්ගේ අධ්‍යාපනය, පෝෂණය, සෞඛ්‍යය, ආරක්ෂාව පිළිබඳ කරුණු රාශියක් සන්නිවේදනය කිරීමට පුළුවන.

ළමා සෞඛ්‍යය පිළිබඳව අතීතයට වඩා වර්තමානයේ ඉතා දියුණු තත්ත්වයක් ලංකාවේ පවතී. ළදරු මරණ අනුපාතිකය පහත බැසීම, ළමා සෞඛ්‍ය සායන පුළුල් කිරීම, එන්නත් ව්‍යාපාරය පුළුල් වීම, බෝවන රෝග අඩු වීම දක්නට ලැබෙන ප්‍රගතීන් ය.

ලංකාවේ රජයේ රෝහල් 2000 වර්ෂය වන විට 578 ක් පැවති අතර,, මධ්‍යම බෙහෙත් ශාලා 389 ක් ද තිබූ අතර වෛද්‍යවරු 6266 ක් ද සහකාර වෛද්‍යවරු 1352 ක් ද ආයුර්වේද 16161 ක් ද සේවයේ නිරත වී සිටියහ. සෞඛ්‍ය පහසුකම් තවදුරටත් පුළුල් කළ යුතු වන්නේ ජනගහනයට ප්‍රමාණවත් වෛද්‍යවරුන් සංඛ්‍යාවක් නොමැති වීමත්, සමහර දුෂ්කර ප්‍රදේශවලට ප්‍රමාණවත් ලෙස රෝහල් පහසුකම් ව්‍යාප්ත වී නොමැතිවීමත් හේතුවෙනි.

ලංකාවේ 2000 දී ඇස්තමේන්තු ජනගහනය වූ දස ලක්ෂ 19,359 න් දශ ලක්ෂ 8,906 ක්ම එනම් 45% ක් පමණ වයස අවුරුදු 20 ට අඩු ළමා හා යෞවන ජනගහනය යි. ලංකාවේ ජනගහන වර්ධන වේගය 1.7% ක් පමණ වන අතර වර්ෂයකට අළුතින් ලක්ෂ තුනකට ආසන්න ප්‍රමාණයක් එකතු වෙති. සෑම වර්ෂයකම අළුතින් ජනගහනයට එකතු වන ලක්ෂ 2.5 - 3,0 ක් පමණ වන මෙම ප්‍රමාණය පිළිගැනීමට අප සූදානම් විය යුතුය. අපගේ ආර්ථිකය ශක්තිමත් කළ යුතු ය. සෞඛ්‍ය සහ පෝෂණය පහසුකම් ද ඉන්පසු පූර්ව ළමා මධ්‍යස්ථාන පහසුකම් ද ඊටත් පසු පාඨශාලා පහසුකම් ද ක්‍රමයෙන් පුළුල් විය යුතුය.

ළමා සහ සුභ සාධනය පිළිබඳව අප ලබන අමිහිරි අත්දැකීම් වනුයේ ළමා අපචාරයන්ට ගොදුරුවීම, ළමා ශ්‍රමය සේවයේ යොද ගැනීම, ළමයින් යුද්ධයට ඇඳ ගැනීම ආදිය යි.

ළමයින් අපචාරයන්ට ගොදුරුවිම කැමැත්තෙන් මෙන්ම බලහත්කාරයෙන් සිදු වේ.

ආර්ථික අපහසුකම් නිසා, මත් ද්‍රව්‍ය වැනි දෑ ආදියෙන් මානසික තත්ත්වයන් විකෘති කිරීම නිසා හෝ නොදැනුවත්කම නිසා කොටසක් අපචාරයන්ට ගොදුරු වෙති. තවත් කොටසක් බලහත්කාරයෙන් අපචාරයන්ට ගොදුරු කර ගනිති. මෙහි භයානකම තත්වයක් වනුයේ දෙමව්පියන්, වැඩිහිටියන් සෙවනේදී ද මෙවැනි අවාසනාවන්ත සිදුවීම් වලට දරුවන් ගොදුරු විමයි.

බාලාපචාර වැළක්වීමේ ඉතා පුළුල් වුන් දැඩිවූත් ක්‍රියාමාර්ග ගැනීම ඉතා අවශ්‍ය ය. මව්පියන්, වැඩිහිටියන්, දරුවන් දැනුවත් කිරීම, ස්වේච්ඡා සංවිධාන, ස්වේච්ඡා සේවක සේවිකාවන්ගේ සේවය ලබා ගැනීම, රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාශීලී සහභාගීත්වය, දැඩි නිතිමය ක්‍රියාමාර්ග ආදිය තුළින් මේවා මර්ධනය කළ යුතුව ඇත.

ළමා ශ්‍රමය යොද ගැනීම තහනම් කිරීමෙහිලා බලපාන නිති රීති දැඩිව ක්‍රියාත්මක කිරීම මෙන් ම ළමා ශ්‍රමය සේවා නියුක්ත විමට බලපාන හේතුන් විශේෂයෙන් පවුල්වල ආර්ථික දුෂ්කරතා ආදිය සඳහා පිළියම් යෙදීමත් අවශ්‍ය ය.

ළමයින් යුද්ධයට ඇඳා ගැනිම පාලනය කිරීමට අන්තර් ජාතික විරෝධත්වය තව තවත් දැඩි කිරීමත් අවශ්‍ය ය. මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව සිදු කිරීමට ඇති කාර්යය ඉතා අල්පය. රතු කුරුස සංවිධානය ඇතුළු අන්තර් ජාතික සංවිධාන මෙහිලා මැදිහත් විය යුතු ය.

ළමා සුභ සාධනයන් හා සංවර්ධනය කෙරෙහි ලංකාවේ බලපවත්වන ප්‍රධානම ප්‍රශ්නය වනුයේ දුප්පත් කම ය.

ලංකාවේ පවුල් දෙලක්ෂයක් පමණ සමෘද්ධිලාභීහු වෙති. එවැනි පවුල්වල දරුවකුගේ අධ්‍යාපනය, සෞඛ්‍ය වෙනුවෙන් වැය කෙරෙනුයේ ඉතා සුළු ආදායම් ප්‍රතිශතයකි. පෙර පාසල් පෝෂණ වැඩ සටහන්, නොමිලයේ දිවා ආහාර වැඩ සටහන් ආදීන් මේ නිසා ඉතා ඵලදායී විය හැකි ය.

අද ළදරුවන්ගේ සදචාර වර්ධනයට යොමු කිරීම ද තවත් වැදගත් අවශ්‍යතාවකි.දහම් පාසැල් අධ්‍යාපනය පමණක් නොව පෙර පාසැලේ පටන්ම සදචාර පුහුණුවීම් ඇති කිරීම මෙන්ම විධිමත් පාසැල්වලදි ඒවා තව දුරටත් වර්ධනය කිරීම වැදගත් ය.

අපගේ දරුවන් සෞඛ්‍ය සම්පන්න සදචාර සම්පන්න බුද්ධිමත් පරපුරක් ලෙස අනාගත සමාජයට දයාද කිරීමට වැඩිහිටියන් වශයෙන් අපි අදිටන් කර ගනිමු. ❑